චක්‍රලේඛ අංකය : 05/2007

මගේ අංකය : එම1/4 (13) වි.උ.ම.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
නො. 280, කෙලින් වීදිය,
කොළඹ 11.

2007.10.03

සියලුම දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල් වරුන්,
සියලුම ප්‍රාදේශීය ලේකම්/දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් වරුන්,
සියලුම ඉඩම් රෙජිස්ට්‍රාර් වරුන් හා අතිරේක
දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් වරුන් වෙත,

**විවාහ, උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා වැඩ බැලීමට පත් කිරීම හා අතිරේක විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු ඇති කිරීම.**

දැනට විවාහ, උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර්වරුන්ගේ වැඩ බැලීම සඳහා නොයෙකුත් හේතූන් මත නව වැඩ බැලීමේ රෙජිස්ට්‍රාර්වරුන් පත් කිරීම නිසා ඔවුන් ස්ථිර කිරීමේදී නොයෙකුත් දුෂ්කරතා වලට දෙපාර්තමේන්තුව මුහුණපා ඇති අතර අධිකරණමය ක්‍රියා වලට ද යොමුවී ඇත. එම නිසා, ඒවා මගහැර ගැනීම සඳහා පහත සඳහන් පරිදි නොපමාවම ක්‍රියා කරන්න.

1. යම් කිසි කොට්ඨාශයක විවාහ, උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් පුරප්පාඩුවක් (හදිසියේ මියයාම, විනය හේතු හා ඉල්ලා අස්වීම ආදී හේතූන් නිසා) ඇතිවූ විට ඒ සඳහා වැඩ බැලීමට නවකයින් පත් කිරීම හැකිතාක් දුරට අවම කරන්න ඒ සඳහා වැඩ බැලීමට,

**"යාබද කොට්ඨාශයේ රෙජිස්ට්‍රාර්වරයා දින 30 කට දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ අත්සනින් පත් කරන්න,** ඒ සමගම නැවත දන්වනතුරු වැඩ බැලීමට කී 77 මගින් නිර්දේශ ද, පුරප්පාඩුව ගැසට් කිරීම සඳහා නිර්දේශ ද එවීමට වහාම පියවර ගන්න.

2. යම් කිසි රෙජිස්ට්‍රාර්වරයකු විශ්‍රාම යාමට දින නියමව තිබේනම් (අවුරුදු 75 හෝ 2006.08.30 න් පසුව පත්වූ අය වයස අවු. 70 කි.) ඊට මාස 6 කට පෙර ඒ බව මා වෙත වහාම දන්වන්න. ඒ සඳහා රෙජිස්ට්‍රාර්වරුන්ගේ ලිපිගොනු යාවත්කාලීනව පවත්වාගෙන යාමට සෑම විෂය භාර කළමනාකරණ සහකාරවරයකුටම උපදෙස් දෙන්න. ඒවා ක්‍රමවත්ව සිදුවන බවට මාස තුනකට වරක්වත් පරීක්ෂාකාරී වන්න. ඒ අනුව රෙජිස්ට්‍රාර්වරයකු විශ්‍රාම යන විට වැඩ බලන අයකුගේ සේවය අවශ්‍ය නොවන ආකාරයට පත්වීම් කිරීම මෙහි අරමුණ බව ද දන්වමි.

3. වැඩ බැලීමෙ අතිරේක විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු ඇති කිරීම සඳහා නිර්දේශ කිරීමේදී ඉතාමත්ම සුපරීක්ෂාකාරීව අත්‍යවශ්‍යම හේතූන් ඇතොත් විනා ඒවා නිර්දේශ කිරීමෙන් වළකින මෙන් මෙයින් ඉල්ලන අතර ඉතා අධික ලෙස අතිරේක විවාහ රෙජිස්ට්‍රාර්වරු පත් කිරීමෙන් අනාගතයේදී විවාහ රෙජිස්ට්‍රාර්වරුන් විසින් නිකුත් කළ විවාහ සහතිකවල පිටපත්, මහජනතාවට ලබාගැනීමෙ දුෂ්කරතාවයන්ට මුහුණපෑම වැළැක්වීමට ද මෙයින් අරමුණු කරමි.

කරුණාකර මෙම චක්‍රලේඛය ලැබුණු බව මා වෙත දන්වන්න.

රෙජිස්ට්‍රාර් ජනරාල්

ජී. එම්. ගුණසේකර
රෙජිස්ට්‍රාර් ජනරාල්

පිටපත් :- 1. ලේකම්, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.
2. ප්‍රධාන කාර්යාලයේ සියලුම මාණ්ඩලික නිලධාරීන් - දැනගැනීම සඳහා
3. සියලුම කළාප භාර සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් - දැනගැනීම සඳහා
4. නියෝජ්‍ය අධ්‍යක්ෂ (සංඛ්‍යාන)